**දවස පුරාම යහපත් දේ සිදුකොට දවසම සුබ දවසක් කර ගනිමු.**

**(අංගුත්තර නිකායේ තික නිපාතයේ මංගල වර්ගය ඇසුරෙනි)**

**ගරු ස්වාමීන් වහන්ස, පින්වත්නි,**

**අද බක් පුර පසළොස්වක පොහොය දිනයයි. බුදුරජාණන් වහන්සේ දෙවන වර ලංකාවේ නාගදීපයට වැඩම කළේ අද වැනි පොහොය දිනයකයි. කැළණියට වැඩම කරවන ලෙස මණිඅක්ඛිත රජතුමා බුදුන් වහන්සේට ආරාධනා කළේද අද වැනි දිනයකය. මිණි පළඟ තැන්පත් කොට නාගදීපය චෛත්‍යය සකස් කිරීම ආරම්භ කිරීමද සිදුවූයේ මෙම පොහොය දිනයේදීය. ආගමික අතින් එවන් වැදගත් දිනයක් වන අද දින ජාතික වශයෙන්ද වැදගත් දිනයකි. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියටද සංක්‍රමණය වන අලුත් අවුරුද්ද අද දිනට යෙදී තිබේ. අද පොහොය දිනයක් වුවත් බොහෝ විහාරස්ථාන වල වෙනදා මෙන් සීල සමාදානාදී පිංකම් කරගැනීමට අවස්ථාවක් නොලැබී ඇත්තේ අළුත් අවුරුදු චාරිත්‍ර එදිනට යෙදී ඇති නිසයි. නමුත් පුණ්‍ය කාලය හෙවත් නැකැත් නැති අවස්ථාවේදී පන්සලට පැමිණෙන ඔබට මේ සදහම් පණිවිඩයෙන් ප්‍රයෝජනයක් ලබා ගත හැකිය.**

**මාසය හැටියට සිංහල ක්‍රමයට ගත් කළ මේ බක් මාසයයි. ගස් වැල් වල පැරණි කොළ ඉවත් වී අලුත් දළු දා එල වලින් බරවන මෙම මාසය බොහෝදෙනා හඳුන්වන්නේ භාග්‍යවන්ත මාසය කියාය. සිංහල අළුත් අවුරුදු සමය තුළ කුඩා දරුවන් වැඩිහිටියන් සියලු දෙනාම ඉතා සතුටු වන්නේ තම ජීවිත වලට එම භාග්‍යය ලැබීම හේතු කොට ගෙනයි. පැරණි අමනාපකම් ඉවතලා සමගිය, සමාදානය ඇතිවන්නේද මෙම මාසය තුළය. අඳින ඇඳුම්, ආහාර පිසන භාජන ආදී සියල්ලම අළුත් වන්නේ අද දිනයේය. ජෝතිෂයට අනුව යෙදෙන නැකත් නම් වූ ශුභ මොහොතට අනුව සියලු කටයුතු කරන්නේද අද වැනි දිනයේය. ඉහත සඳහන් කළ සියලුම පැරණි දේ අලුත් වන මෙවන් දිනයක සමාජය තුළ ජීවත් වන අයගේ පැරණි වැරදිද ඉවත් විය යුතුයි. එවිට මිනිසුන්ද අලුත් මිනිසුන් බවට පත්වේ. සජීවී මිනිසුන්ද එසේ අලුත් උනොත් පමණි, අපට භාග්‍ය උදාවන්නේ.**

**ගිහි පැවිදි අපේ ජීවිත අලුත්කර ගැනීම සඳහා අවශ්‍ය වන්නේ බුද්ධ චරිතය ආදර්ශයට ගනිමින් දේශනා කළ ධර්මයට අනුව අපේ ජීවිත සකස් කර ගැනීමයි. බුදුන් වහන්සේගේ චරිතය දෙස බලන විට පෙනී යන්නේ වෙලාවට වැඩ කළ චරිතයක් ලෙසයි. අපි බෞද්ධයන් ලෙස කටයුතු කරන්නේ නම් අපද වෙලාවට වැඩ කළ යුතුයි. අපේ රටේ බොහෝ දෙනා වෙලාවට වැඩ කරන්නේ අලුත් අවුරුදු දිනයට පමණි. ජෝතිෂය කියන පරිදි පුණ්‍ය කාලය, ආහාර පිසීම, ආහාර අනුභවය, ගනුදෙනු කිරීම, ස්නානය, රැකියා බලා පිටත් වීම ආදී සියලු දේ නියම වෙලාවට සිදුවේ. අවුරුදු දිනයෙන් පසුව බොහෝ දෙනෙකුට ඒවා අමතක වෙයි. අපේ රටේ උත්සවයක් හෝ රැස්වීමක් නියමිත වෙලාවට පටන් ගන්නේ ඉතාම කලාතුරකින් තැනක පමණි. කාලයේ වටිනාකම දන්නා භාග්‍යවන්ත අය එසේ කළත්, බොහෝ දෙනා එසේ කරන්නේ නැත, එය සමාජයේ අභාග්‍ය ලෙස දැක්විය හැක.**

මේ තත්වය යටතේ අද මෙම සදහම් පණිවිඩයෙන් හඳුන්වාදීමට අදහස් කරන්නේ බුදුදහම උගන්වන සුභ මොහොත කුමක්ද? කියායි. යම්කිසි කටයුත්තකට සුදුසු වෙලාව පැමිණියහොත් එය ඒ වෙලාවට ඉටු කල යුතුයි. එය අපේ සුභ මොහොතයි. අංගුත්තර නිකායේ තික නිපාතයේ මඞගල වර්ගයේ එන 3-3-5-10 යන සූත්‍රය මේ කාරණය මැනවින් පැහැදිලි කර දෙන තැනකි. මෙහිදී එම සූත්‍රය කෙටියෙන් සරළව තේරුම් ගැනීමට උත්සාහ කරමු.

"පින්වත් මහණෙනි, යම් කෙනෙක් උදේ කාලයේ කයින්, වචනයෙන්, සිතින් යහපතෙහි හැසිරෙනවානම් ඒ අයට එම උදය සුභ උදෑසනකි.

"යෙහි භිකඛවෙ සතතා පුබබනහ සමයං කායෙන සුචරිතං චරනති. වාචාය සුචරිතං චරනති මනසා සුචරිතං චරනති. සුපුබබනෙහා භිකඛවෙ තෙසං සතතානං"

"යමෙක් දහවල් කාලයෙහි ඉහත කී ආකාරයට තිදොරින් යහපතෙහි හැසිරෙන්නේ නම් එය එම සත්වයින්ට සුභ දහවලකි.

"සුමජඣනතිකො තෙසං සතතානං"

"යමෙක් ඉහත කී ආකාරයට සවස් කාලය තුළ තිදොරින් යහපතෙහි හැසිරෙන්නේ නම් එය ඔහුට සුභ සවස් කාලයකි.

"සුසායනෙහා භිකඛවෙ තෙසං සතතානං" මෙම සූත්‍රය තුළ සටහන් වී නැතත් රාත්‍රී කාලය තුළින් ඉහත කී ආකාරයට තිදොරින් යහපතෙහි හැසිරෙන්නේ නම් එය ඔහුට සුභ රාත්‍රියකි.

මේ සූත්‍රය ගිහි පැවිදි අප හැමදෙනාටම උගන්වන්නේ දවසම සුභ දවසක් කරගන්නා ආකාරය ගැනයි. නමුත් අපේ බොහෝ දෙනා පුරුදු වී ඇත්තේ ප්‍රාර්ථනාවක් තුළින් සුභ දිනයක් උදාකර ගැනීමටයි. සුභ උදෑසනක් වේවා, සුභ සන්ධ්‍යාවක් වේවා, සුභ රාත්‍රියක් වේවා යනු නිතර අපට ඇසෙන ප්‍රාර්ථනාවෝය එසේ ප්‍රාර්ථනා කිරීම නරක නැත. නමුත් එම ප්‍රාර්ථනාවෙන් පමණක් සුභ දවසක් උදාකර ගත නොහැක. එසේ නම් අප සියලු දෙනා තිදොර සංවර කරගෙන සිල්වත් පිරිසක් හැටියට ගත කරන්නේ නම් එය අපට සුභ දිනයකි. බෞද්ධයාට පොහොය දිනය සුභ දිනයක් වන්නේ වෙනදාට වඩා තිදොර සංවර කරගැනීමක් එදිනට සිදුවන බැවිනි.

තවදුරටත් මෙම සූත්‍රය ගාථා තුනකින් මෙම සුභ මොහොත ගැන විස්තර කර දෙයි.

"උතුම් බ්‍රහ්මචාරීන් වහන්සේලා උදෙසා මැනවින් පුදන ලද දානයක් ඇත්ද? ඒ දන් දෙන වෙලාව තමයි සුභ නැකත. සුභ මංගල්‍යය, සුභ උදෑසන, සුභ නැගී සිටීම, සුභ මොහොත, සුභ මුහුර්තිය"

"සුනක්ඛත්තං සුමංගලං සුපපභාතං සුවුට්ඨිතං

සුඛණෝ සුමුහුත්තෝච සුයිට්ඨං බ්‍රහ්ම චාරිසු"

මැනවින් කරන ලද කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම ඉතා සුභ දේය. යහපත් බලාපොරොත්තු ඉතා සුභ දේය. මනාවූ දේවල් කරන විට මනාවූ දේවල්ම ලැබෙන්නේය.

පදක්ඛිණං කාය කම්මං වාචාකම්මං පදක්ඛිණං

පදක්ඛිණං මනොකම්මං පණිධියෝ පදක්ඛිණා

පදක්ඛිණානි කත්වාන ලභන්තත්ථෙ පදක්ඛිණේ

"යහපත උදාකරගෙන සැපවත්ව බුදු සසුනෙහි අභිවෘද්ධිය සලසා ගත් ඔබ සියළු ඥාතීන් සමග නිරෝග වෙන්න. සුවපත් වෙන්න.

"තෙ අත්ථලද්ධා සුඛිතා විරූළ්හා බුද්ධසාසනෙ

අරොගා සුඛිතා හොථ සහ සබ්බෙහි ඤාතිභීති"

අද වැනි පොහොය දිනයක මෙවන් සඳහම් පණිවිඩයක් ලබාදීමට අදහස් කළේ නූතන සමාජයේ බොහෝ දෙනා මිත්‍යා මත වල එල්බ සිටිනා බැවිනි. අද සුභ මොහොත තීරණය කරන්නේ

ජෝතිෂවේදීන්ය. ජෝතිෂය පැරණි විද්‍යාවකි. එය බොරුවක් මිථ්‍යාවක් යැයි නොකියමි. නමුත් බුදුදහම කියන්නේ හොඳම නැකත හොඳම වේලාව යම් කටයුත්තක් කිරීමට තිබෙන සුදුසුම වේලාව බවයි. උදේට කන වේලාවක් තිබේ. දවල්ට කන වේලාවක් තිබේ. ඒ වෙලාව සුභම වේලාවයි. චීනය වැනි රටවල උදේ 8 වන විට උදේ කෑම අවසන් වේ. දවල් කෑම 1 වන විට අවසන් වේ. චීනයේ ඇත්තේ සුභ නැකත හා සුභ වේලාවයි. උදේට බඩගිනි වන වේලාව හා දවල්ට බඩගිනි වන වේලාව උදේ සහ දවල් කෑමට සුදුසුම නැකතයි. නමුත් අපේ රටේ දවල් 2 ටත් උදේ කෑම තිබේ. සවස 5 ටත් දවල් කෑම තිබේ. ඒ රටවල රාත්‍රී 9 වන විට රෑ කෑම ගනී. කෑමෙන් පසු පැය 2ක් පමණ තමන්ගේ වැඩ වල නිරත වී නින්දට යති. අපේ රටේ බොහෝ දෙනා රාත්‍රී 11 පමණ රාත්‍රී කෑම ගෙන අත සෝදාගත් ගමන් නින්දට යති. මේ සිදු වී තිබෙන්නේ කුමක්ද? යමකට සුදුසු වේලාව තීරණය කර ගැනීමට ඇති නොහැකියාවයි. අද බොහෝ දෙනා අවුරුදු නිසා සියලු වැඩ වෙලාවට කරනු බව පෙනේ. නමුත් හෙට සිට පරණ විදියටම කති. බොති. ඉතින් අපේ අලුත් වීමක් තිබේද? ඇඳුම් අලුත්ය. කෑම බීම අලුත්ය. භාජන අලුත්ය. නමුත් අපි බොහෝ දෙනෙක් පරණ මිනිසුන් වෙමු.

මෙම සූත්‍රය උගන් වන පරිදි උදේ - දවල් - සවස යන අවස්ථා තුනම සුභ අවස්ථා ලෙස පත්කර ගන්නට නම් කය වචනය සිත යන තිදොරින් සුභ දායක දේ කළ යුතුයි. පරපණ නැසීම, අනුන් සන්තක දේ සොර සිතින් ගැනීම, අනවශ්‍ය ආකාරයේ කාම සම්පත් පරිහරණය කිරීම කයින් වන වැරදි තුනයි. කය තුළ පවත්නා අනිත්‍ය බව අස්ථිර බව අවබෝධ වූ කිසිවෙක් මේ වැරදි නොකරති. එවන් පුද්ගලයා උදේ දවල් සවස යන හැම අවස්ථාවකම සහනයෙන් කටයුතු කරයි. එවිට ඔහුට එය සුභ දවසකි. නමුත් කායානුපස්සනාව නොමැති පුද්ගලයෝ කය මෙහෙයවා කරන වැරදි නිසා උදේ- දවල් - සවස අසහනයෙන් යුක්තව කටයුතු කරති. ඔහුට මංගල්‍යයක් සිදු නොවන අතර අවමංගල්‍යයක්ම ලංකර ගනී. මෙහි අවමංගල යන වචනයෙන් දැක්වූයේ කායික මරණය නොව මානසික මරණයයි.

වචනයෙන් සිදුවන වැරදි හතරකි. බොරුව - කේලම - එරුසවචනය හා හිස් වචනයයි. අපේ අදහස් අනුන්ට සංනිවේදනය කරන විට මෙම වැරදි හතරෙන් වෙන් විය යුතුයි. එවිට ඔහුට සුභ උදෑසනක්, සුභ දහවලක්, සුභ සන්ධ්‍යාවක් ඇති කරගත හැකිය. මේ වැරදි හතරට අනුව කටයුතු කරන අදක්ෂයාට මුළු දවසම අවමඟුලකි.

සිතින් වන වැරදි තුන ලෙස දැක්වෙන්නේ දැඩි ලෝභය - ක්‍රෝධය - මිත්‍යා දෘෂ්ටියයි. මේ වැරදි වලට යොමුවූ සිත් ඇත්තාට උදේ - දවල් - සවස යන හැම අවස්ථාවක්ම අසහනයකි. මෙයින් මිදී සිත සන්සුන් කරගත් පුද්ගලයාට දවසම යහපත් වේ. ඒ ජීවිතය තුළ හැම මොහොතක්ම සුභ දායකය. අලුත් අවුරුදු උදාවූ මේ පෝය දිනයේ සමහරු උදේ කාලයේ පුණ්‍ය කාලය බැවින් තිදොර සංවර කරගෙන සිටී. ඒ නිසා ඔහුගේ උදේ කාලය සුභය. නමුත් දවල් - සවස - රාත්‍රී යන අවස්ථා තුනේදීම තිදොර අසංවර කරගෙන ජීවත් වෙති. ඒ නිසා ඔහුට එම කාලය අසුභය. ඒ නිසා ගිහි පැවිදි වශයෙන් දෙවැදෑරුම් වන මේ සමාජය තුළ අමාරුවෙන් ලබා ගත් මනුෂ්‍ය ආත්ම භාවයේ දුර්ලභ බව තේරුම්ගෙන මුළු ජීවිතයම මංගල්‍යයක් බවට පත්කර ගැනීමට උත්සාහ ගත යුතුයි.

මෙතෙක් ප්‍රකාශ කළ අදහස් නැවත ගාථා තුනකින් මෙම සූත්‍රය පැහැදිලි කරයි. උතුම් බ්‍රහ්මචාරීන් වහන්සේලා වෙත මැනවින් පුදන ලද දානයක් වේ නම් ඒ දානය දෙන වෙලාව සුභ නැකතයි. සුභ මංගල්‍යයයි. සුභ උදෑසනයි. සුභ නැගී සිටීමයි. සුභ මොහොතයි. සුභ මුහුර්තයයි. වචන කීපයකින්ම අදහස් කළේ මැනවින් දෙන දානය උතුම් බවයි. අද බොහෝ දෙනා දෙන දාන දෙස බැලීමේදී ඒවා මැනවින් නොදෙන බව පෙනේ. මෙහි මැනවින් යැයි සඳහන් කොට ඇත්තේ තිදොර සංවර කරගෙන කරන දානයයි. අද බොහෝ දෙනා දෙන දාන වල පෙනෙන්නේ කීර්ති ප්‍රශංසා අපේක්ෂාව දෙව්ලොව මිනිස් ලොව යාමේ කැමැත්ත වැනි අදහස් රජකරන බවයි. එවැනි දන් දීමෙන් සිදුවන්නේ සසර තවත් දික්කර ගැනීමකි. ඒ නිසා කළ යුත්තේ නිර්ලෝභී චේතනාව පෙරදැරි කරගෙන දෙන දානය පුරුදු කර ගැනීමයි. එසේ කරන පුද්ගලයාගේ මුළු ජීවිතයම මංගල්‍යයකි. මෙම සූත්‍රය ඉදිරිපත් කරන කරුණු අවංකව තම ජීවිතය තුළ ප්‍රදර්ශනය කරගත හොත් මුළු දවසම සුභ වෙයි. ඒ තත්වය දිගටම ගෙන ගියොත් මුළු මාසයම සුභ වෙයි. ඉදිරිටත් එසේම ක්‍රියාත්මක වුවහොත් අවුරුද්දම සුභ වෙයි. නමුත් නූතන සමාජය තුළ අවුරුද්දටම එක දිනයක් යොදාගෙන එයිනුත් උදේ කාලය පමණි. සුභ දායක කරගන්නේ දවසේ ඉතිරි කාලයම අසුභදායකව ගෙවා දමයි. මේකද? අපේ අවුරුද්ද කියා අප අපෙන්ම ප්‍රශ්න කර ගනිමු.

බුද්ධ ධර්මයේ ගුණ හඳුන්වන තැන "සවාකඛාත" යනුවෙන් ගුණ පදයක් එයි. එයින් කියවෙන්නේ මැනවින් දේශනා කොට ඇත යන්නයි. ඒ නිසා ඒ ධර්මයේ එක් වචනයක්වත් අඩු කරන්නට කාටවත් බැරිය. තවත් වචනයක් එකතු කරන්නවත් බැරිය. එවැනි දහමක් අනුගමනය කරන අප සිතාගත යුත්තේ සුභ නැකත හා සුභ වේලාව ඒ කටයුත්ත සඳහා සුදුසුම වෙලාව බවයි. බමුණන් කීවේ ශිෂ්‍ය ජීවිතයේදී ඉගෙන ගත යුතු බවයි. තරුණ වයසට පත් වූ විට විෂය රසය අනුභව කළ යුතුයි කියාය. මෙහි අර්ථය කුමක්ද? ඉගෙන ගත යුතු කාලයේදී ඉගෙන ගත යුතු බවයි. එය ඔහුගේ සුභ මොහොතයි. එය අමතක කොට තරුණ වයසට පත් වූ විට ඉගෙනීමේ කටයුත්ත කළ නොහැකිය. වෙලාව වරදවා ගැනීම යනු නැකත වරදවා ගැනීමයි.

මේ කරුණු හොඳින් සිතා බලා කටයුතු කළොත් අද සිට ඉදිරියට එන සෑම දිනයක්ම මංගල දිනයක් ලෙස සැලකිය හැක. මංගල යනු දියුණුවේ මගයි. ඒ නිසා අද සිට වේලාවට වැඩ කිරීමට පුරුදු වෙමු. අද කළ යුතුදේ අදම කරමු. හෙටට කල් නොතබමු. අද සිට පරණ අදහස් ඉවතලා අලුත් අදහස් ඇති කර ගනිමු. දුම්පානය, සුරාපානය වැනි කලු කර්ම කරන හැම දෙනාම ඒවායින් මිදී සුදු කර්ම කිරීමට උත්සාහ දරමු. ඉගෙනුම ලබන දරුවන් ඉගෙනීමට නොගැලපෙන දේවලින් ඉවත්ව ගැලපෙන දේ පමණක් කරමු. ගිහි පැවිදි යන හැම දෙනාම තිදොරින් සංවර වී යහපත් දේ කරමින් දවසම සුභ දවසක් කර ගනිමු.